NALANDA VIDYALAYA **නාලන්දා විද්‍යාලය - කොළඹ 10**

**ඒකක පරීක්ෂණ ව්‍යාපෘතිය**

| | | |
|---|---|---|
| **6 ශ්‍රේණිය** | **නර්තනය** | **ඒකකය : 3** |

## ගැමි නැටුම්

- **ප්‍රශ්න අංක 1 සිට 12 දක්වා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1) නිර්මාතෘවරයකු හඳුනාගත නොහැකි (කර්තෘ අඥාත) ගායනා විශේෂයක් ලෙස සලකන්නේ,
   1) ප්‍රශස්ති ගීත
   2) සංදේශ කාව්‍ය ගීත
   3) ගැමි ගීත
   4) සරල ගීත

2) ගැමි නැටුමක තිබිය යුතු ලක්ෂණයකි,
   1) සරල බව
   2) සංකීර්ණ බව
   3) ශාස්ත්‍රීය බව
   4) වේගවත් බව

3) ශ්‍රී ලාංකේය ජන ගී,
   1) තාලානුකූල ගායන සඳහා රචනා වී ඇත.
   2) රිද්මයානුකූල ගායන සඳහා රචනා වී ඇත.
   3) තාලානුකූල සහ රිද්මයානුකූල ගායනවලින් යුක්තය.
   4) ගැඹුරු වියත් බසකින් රචනා කර ඇත.

4) ජන ගායනා නැතහොත් ගැමි ගීතයන්ගේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ,
   1) වියත් රචකයන්ගේ නිර්මාණ වීම.
   2) සංකීර්ණ නාදමාලාවලින් යුක්ත වීම.
   3) සාමූහික ගායනයට උචිත ලෙස රචනා වීම.
   4) සරල පද මාලා සහ සරල නාදමාලාවෙන් යුක්ත වීම.

5) කළගෙඩි නැටුම
   1) කාන්තාවන්ට උචිත ගැමි නැටුමකි.
   2) කාන්තාවන්ට උචිත තාණ්ඩව නැටුමකි.
   3) ගායනය රහිත සමූහ නර්තනයකි.
   4) කාන්තාවන්ට උචිත ශාස්ත්‍රීය නර්තනයකි.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

Agaram.LK - Keep your dreams alive!

6) 'අහසට පිඹිනා එරන් කළේ යා' යන කවිය ගැයිය යුතු තාල රූපය කුමක් ද?

1) මාත්‍රා 2 තනි තිත 2) මාත්‍රා 3 තනි තිත

3) මාත්‍රා 4 තනි තිත 4) මාත්‍රා 2 + 3 දෙතිත

7) ලී කෙළි නැටුම ප්‍රභවය ලබන්නට ඇතැයි සලකන්නේ,

1) ගැමි ජීවන වෘත්තීන් පදනම් කරගෙන
2) ගැමි ශාන්තිකර්ම ඇසුරෙන්
3) පැරණි මුගුරු සටන් අභ්‍යාස ඇසුරෙන්
4) ආගමික පුද පූජා ඇසුරෙන්

8) 'ඉරට ඔබිය ඉර මුදුනේ සිටීයා ' මෙය,

1) ගොයම් කැපීමේ කවියකි. 2) ලී කෙළි කවියකි.

3) නෙළුම් කවියකි. 4) කුළු නැටුමේ කවියකි.

9) ලී කෙළි නැටුමක පැරණි ලී කැටයමක් දක්නට ඇත්තේ,

1) දළදා මාලිගාවේ ය. 2) ගඩලාදෙණිය විහාරයේ ය.

3) රත්නපුර සමන් දේවාලයේ ය. 4) ඇම්බැක්ක දේවලයේ ය.

10) කළගෙඩි නැටුමට සහ ලී කෙළි නැටුමට අදාළ චලන පිළිවෙලින් ගත් කළ,

1) ලාස්‍ය හා තාණ්ඩව ලක්ෂණවලින් යුක්තය.
2) තාණ්ඩව හා ලාස්‍ය ලක්ෂණවලින් යුක්තය.
3) නර්තන දෙකම තාණ්ඩව ලක්ෂණවලින් යුක්තය.
4) නර්තන දෙකම ලාස්‍ය ලක්ෂණවලින් යුක්තය.

11) ලී කෙළි නැටුමක් නිර්මාණයේ දී එහි ප්‍රාසංගික සුන්දරත්වය ඇතිකිරීම සඳහා,

1) මධ්‍ය ලයට අනුව ජවය පවත්වාගත යුතුය.
2) විලම්බ ලයට අනුව චලනයේ ලාලිත්‍ය තිබිය යුතුය.
3) දෘත ලයට අනුව චලනය සංකීර්ණ විය යුතුය.
4) විවිධ ලය මානයන්ට අනුව චලනයේ විවිධත්වය සහ යෝග්‍යතාව තිබිය යුතුය.

12) ගැමි නැටුම් නිර්මාණයක් කෙරෙහි ප්‍රේක්ෂක අවධානය පවත්වා ගැනීමට නම්,

1) එකම තාල රූපයකට අනුව කළ යුතුය.
2) එකම ලය මානයක් පවත්වා ගත යුතුය.
3) පේළිය හෝ දෙපේළියේ සිට නර්තනය කළ යුතුය.
4) ඒකාකාරිත්වයෙන් තොර විය යුතුය.

- **හිස්තැන් පුරවන්න.**

13) 'පේළි සැදී අඟනෝ සැරසීලා' මෙය ............................................................. කවියකි.

14) 'එක පඳුරෙන් ලී සයක් කපාගෙන' යන කවිය ගායනා කරන්නේ ........................................................... නැටුම සඳහාය.

15) දරුවන් නැළවීම සඳහා ගායනා කරන කවි හඳුන්වන්නේ .................................................................... යනුවෙනි.

16) පහත සඳහන් කවිය සම්පූර්ණ කරන්න.

අහසට ...................................... එරන් කළේ යා
පොළොවට පිඹිනා .............................. කළේ යා
....................................... දහසක් වටින කළේ යා
.................................... නෑනෝ මගේ කළේ යා

- **ප්‍රශ්න අංක 17 සිට 28 දක්වා හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද වරහන තුළ යොදන්න.**

17) 'කෙළි' යන වචනයේ අදහස ක්‍රීඩාවයි. ( )
18) ගැමි නැටුමේ දී ස්වභාවික වස්තූන් දේවත්වයේලා අදහනු නොලබයි. ( )
19) 'ලී මල්ලිය' භාවිත කිරීම ලී කෙළි නැටුමේ විශේෂත්වයකි. ( )
20) ගැමි නැටුමෙහි ගැමියන්ගේ සිතුම් පැතුම් හා ඇදහිලි විශ්වාස අන්තර්ගත නොවේ. ( )
21) ලී මල්ලියටම 'අට මල්ලිය' , 'ලණු දඟය' ලෙස ද ව්‍යවහාර කරයි. ( )
22) 'අහසේ දෙවියෝ රැස්ව සිටින්නයි' යනු කළගෙඩි නැටුමේ එන කවියකි. ( )
23) කාන්තාවන් පමණක් නර්තනයේ යෙදීම ගැමි නැටුමක දැකිය හැකි ලක්ෂණයකි. ( )
24) කළගෙඩි මාලයේ කවි කළගෙඩි නැටුම සඳහා භාවිත කරයි. ( )
25) 'බෝ අත්තට වැඳ සිරස නමන්නේ' යනු කළගෙඩි කවියකි. ( )
26) ලී කෙළි නැටුමක අවස්ථාවක් ඇම්බැක්කේ දේවාලයේ කැටයම් කර ඇත. ( )
27) 'එමකම' ගැමි නැටුම්වල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණයකි. ( )
28) සරල චලන වුවද නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීම ගැමි නැටුමක විචිත්‍රත්වයට හේතු වේ. ( )

- **කෙටි පිළිතුරු සපයන්න.**

29) ගැමි නැටුම් යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න.
30) ගැමි නැටුම් 06ක් නම් කරන්න.
31) ගැමි නැටුම්වල දක්නට ලැබෙන ලක්ෂණ 04ක් නම් කර ඒවා කෙටියෙන් හඳුන්වන්න.
32) ගැමි නැටුම් රඟ දක්වන අවස්ථා 04ක් නම් කරන්න.
33) ඔබ උගත් කළගෙඩි කවියක් ලියන්න.
34) කළගෙඩි නර්තනයක දැකිය හැකි විශේෂ ලක්ෂණ 03ක් ලියන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

35) කළගෙඩි නැටුමක් නිර්මාණය කිරීමේ දී එම නර්තනයට ඇතුළත් විය යුතු, චලන නිර්මාණයට සුදුසු අවස්ථා 03ක් ලියන්න.

36) ලී කෙළි කවිවල දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ 03ක් නම් කරන්න.

37) ලී කෙළි නැටුමේ දක්නට ලැබෙන සුවිශේෂ ලක්ෂණ 03ක් නම් කරන්න.

38) ඔබ උගත් මාත්‍රා 3 තනි තිතට ගැයෙන ලී කෙළි කවියක් ලියන්න.

39) ඔබ උගත් නෑළවිලි කවි 02ක් ලියන්න.

40) නෑළවිලි කවි ගායනයේ දී ඔබ අවධානය යොමු කළ යුතු විශේෂ ලක්ෂණ 02ක් ලියන්න.

**සැකසුම : නවමල් ජයවීර**

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

Agaram.LK - Keep your dreams alive!